මුතූර් ප්‍රාදේශිය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 13 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 පෙබරවාරි මස 25 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට මුතූර් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රු.400,007 කට මිලදී ගත් පුස්තකාල පොත් ගිනුම්ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.17,615 ක් වූ විගණන ගාස්තු සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---

(අ) 1997 වර්ෂය සඳහා වටිනාකම රු.22,806 ක් වූ දුරකථන බිල්පත් ගෙවීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 1986 වර්ෂයේ සිට සභාව විසින් නිළධාරීන්ගෙන් අයකරගන්නා ලද සේවක අර්ථසාධක අරමුදලේ සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් එකතුව වූ රු.355,405 ක් අදාළ අරමුදල් වලට ප්‍රේෂණය නොකර තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගන්නා ලද රැඳවුම් මුදල් රු.615,203 ක් තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඈ) 1984 වර්ෂයේ සිට පැවත එන රු.1,218,550 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 4,443,627 | හිමිකම් ඔප්පු |
| සාප්පු සංකීර්ණ | 20,375,659 | ස්ථාවර වත්කම් ලේඛණ සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 618,659 | ස්ථාවර වත්කම් ලේඛණ සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු | 1,057,420 | ස්ථාවර වත්කම් ලේඛණ සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 23,026,590 | ස්ථාවර වත්කම් ලේඛණ සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලැබිය යුතු අත්තිකාරම් | 21,872 | කාල විශ්ලේෂණ සහ විස්තරාත්මක ලැයිස්තු |
| වට්ටෝරු භාණ්ඩ තොගය | 48,588 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |

1.3.4 අවිනිශ්චිත ගිණුම

----------------------

මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වුණු 2000 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමෙහි බැර ශේෂයේ එකතුව රු.11,594 ක් විය. මෙම ශේෂයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

පහත සහ සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල වීමේ විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා රීති ( මූල්‍ය සහ පරිපාලන ) – 1988 | | |
| | i. III පරිච්ඡේදයේ 15 වගන්තියේ 81 උපවගන්තිය | - | පහත සඳහන් ප්‍රතිපූර්ණ අයදුම් පත් එක් එක් කාර්තුවේදී අදාල නිලධාරීන් වෙත ඉදිරිපත් කර නොතිබුණි.<br>i. දේපළ මාරු කිරීම් වලට අදාළ මුද්දර බදු ප්‍රතිපූර්ණය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් සහ භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත.<br>ii. උසාවි දඩ ප්‍රතිපූර්ණය සඳහා උසාවි රෙජිස්ට්‍රාර් වෙත |
| | ii. ix පරිච්ඡේදයේ රීති අංක 180 | | චෙක්පත් අත්සන් කිරීම, මුදල් භාරකාරත්වය සහ ගබඩා පරිපාලනය සඳහා බලය පවරනු ලැබූ නිලධාරීන් තිදෙනෙකු ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.14,000,313 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.5,610,450 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,389,853 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 ආදායම් පරිපාලනය

--------------------------

#### 2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

---------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදාය සහ හිඟ ආදායම පිළිබඳ ඉදිරිපත් කරන ලද තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| i. | වරිපනම් සහ බදු | 791,500 | 613,525 | 4,391,078 |
| ii. | කුලී | 6,524,240 | 1,264,951 | 6,894,149 |
| iii. | සේවා ගාස්තු | 5,289,500 | 784,312 | 86,519 |
| iv. | වෙනත් ආදායම් | 25,955,756 | 37,781,628 | 331,940 |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

(අ) වර්ෂ 10 ක කාලපරිච්ඡේදයක් තුල අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ප්‍රාදේශීය සභාවට භාරදුන් මෝටර් වාහන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී පුර නැගුම වැඩසටහන යටතේ රු.22,820,738 ක පිරිවැයක් දරා කඩ කාමර 40 ක් ඉදිකර තිබුණු අතර එයින් කඩ කාමර 13 ක් කුලී අයකර ගැනීමකින් තොරව භාරදී තිබුණි. අනෙකුත් කඩකාමර 2014 දෙසැම්බර් 28 දින දක්වා කුලියට දී නොතිබුණි. කෙසේ වුවද එක් එක් කඩකාමරය සඳහා රු.50,000 ක අත්තිකාරමක් ලබාගෙන ඇති බව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා 2015 ජනවාරි 06 දිනැති ලිපියෙන් දන්වා තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) මුතූර් නව බස් නැවතුම් පොළෙහි ඉදිකරන ලද සාප්පු සංකීර්ණය

-------------------------------------------------------------------------------

නව බස් නැවතුම් පොලෙහි රු.22,820,738 ක වටිනාකමක් වූ , සාප්පු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිමකොට 2012 ඔක්තෝබර් 30 දින භාරදී තිබුණි. මෙම ගොඩනැගිල්ලෙහි බිත්ති ඉරිතලා තිබුණු බවත් සමහර ස්ථාන වල කොන්ක්‍රීට් වැඩ නිසි පරිදි සිදුකර නොතිබුණු බවත් 2014 දෙසැම්බර් 18 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂනයේදී අනාවරණය විය. කෙසේ වුවද අඩුපාඩු සැලකිල්ලට නොගෙන සියළුම කොන්ත්‍රාත් මුදල් සහ රඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) මුතූර් නව බස් නැවතුම් පොළෙහි ඉදිකරන ලද වෙළඳසැල් ගොඩනැගිල්ල

-----------------------------------------------------------------------------------------

මුතූර් බස් නැවතුම් පොළෙහි වෙළඳසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මුතූර් ප්‍රාදේශීය සභාව විසින් 2013 අගෝස්තු 27 දින රු. 23,366,108 ක් වූ වටිනාකමට ගිවිසුමක් අත්සන් කර තිබුණි. දිගින් මීටර් 350 ක් වූ තාප්පය ඉදිකිරීම සඳහා රු.269,850 ක් ගෙවා තිබුණු නමුත් එම තාප්පයට සම්පූර්ණයෙන් හානි වී තිබූ බව නිරීක්ෂනය විය.

4. පද්ධති සහ පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් එකතු කිරීම

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය